**වැල්ලවාය ප්‍රාදේශීය සභාව**
**මොනරාගල දිස්ත්‍රික්කය**
**------------------------------**

## 1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

### 1.1 <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 28 දින විගණනයට ඉදිරිපත්කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ජුනි 20 දින සභාපතිවරයාට යවා ඇත.

### 1.2 <u>තත්ත්වාගණනය කළ මතය</u>

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට වැල්ලවාය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>

#### 1.3.1 <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) ප්‍රාදේශීය සභාව සතු ඉඩම් කැබලි 17ක් තක්සේරුකර ගිණුම්ගතකර නොතිබුණි.

(ආ) වැල්ලවාය ආනපල්ලම ආදාහනාගාරය වටා සමාලෝචිත වර්ෂයේදී ඉදිකර තිබුණු රු.1,628,766ක් වටිනා දැල්වැට ප්‍රාග්ධනීතකර නොතිබුණි.

(ඇ) ඔප්පු අංක 1207 මගින් 2017 මාර්තු 24 දින සභාව වෙත ලබාදී තිබුණු මොරගහහේන්යාය පිහිටි රු.500,000ක් වටිනා පර්චස් 36ක ඉඩම ගිණුම්ගතකර නොතිබුණි.

(ඈ) පුරනැගුම ව්‍යාපෘතිය යටතේ ආනපල්ලම ආදාහනාගාර ගොඩනැගිල්ල ඉදිකිරීමේදී ගෙවූ රු.1,813,132ක එකතු කළ අගය මත බදු වටිනාකමද ප්‍රාග්ධනීතකර තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේදී පුරනැගුම ව්‍යාපෘතියෙන් ලැබී තිබුණු රු.682,000ක් වූ Bulky waste Compress යන්ත්‍රය ගිණුම්ගතකර නොතිබුණි.

(ඊ) පුස්තකාල ස්වයංක්‍රීයකරණ ව්‍යාපෘතිය යටතේ පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශයෙන් වැල්ලවාය මහජන පුස්තකාලයට ලැබී තිබුණු එකතුව රු.262,592ක් වූ උපකරණ ගිණුම්ගතකර නොතිබුණි.

(උ) වැල්ලවාය මහජන පුස්තකාලයට මිලදීගෙන තිබුණු රු.64,125ක කාර්යාල උපකරණ රු.37,500ක් අඩුවෙන් ප්‍රාග්ධනීතකර තිබීම නිසා ලී බඩු හා සවිකිරීම් සහ ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීම එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඍ) වතු ආන්තික ගම්මාන වැඩසටහන යටතේ සුනන්ද කඩේ සිට 36 යාය මාර්ගය සංවර්ධනය කිරීමේ කර්මාන්තයේ නිම්වැඩ වටිනාකම ලැබිය යුතු කර්මාන්ත ආධාර යටතේ රු.300,000ක් වැඩියෙන් ගිණුම්ගතකර තිබුණි.

(එ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු වියදම් රු.116,774ක් ගිණුම්ගතකර නොතිබුණි.

(ඒ) සමාලෝචිත වර්ෂයේ වරිපනම් බදු අය කිරීමේදී ලබාදී තිබුණු රු.134,308ක වට්ටම වරිපනම් බදු ගිණුම බැර නොකර හිඟහිටි වරිපනම් බදු ගිණුම බැරකර තිබුණි.

(ඔ) ඉදිරි වර්ෂයට අදාලව ලැබී තිබුණු රු.121,030ක උපමානපාදක ප්‍රතිපාදන ලැබිය යුතු වෙනත් ආදායම් ලෙස ගිණුම්ගතකර තිබුණි.

**1.3.2** <u>**නොසැසඳුණු ගිණුම්**</u>

පොදු ලෙජරය අනුව කර්මාන්ත අත්තිකාරම් ගිණුමේ රු.397,572ක බැර ශේෂයක් පෙන්නුම් කළ නමුත් කර්මාන්ත අත්තිකාරම් උපලේඛනයට අනුව එය රු.160,914ක හර ශේෂයක් විය.

**1.3.3** <u>**ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**</u>

**(අ)** <u>**ලැබිය යුතු ගිණුම්**</u>

(i) සභාව සතු J.C.B යන්ත්‍රය හා මෝටර් ග්‍රේඩරය ඉකුත් වර්ෂවල කුලියට දීමෙන් අයවිය යුතු රු.639,270ක් සමාලෝචිත වර්ෂයේදීද අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි.

(ii) ඉකුත් වර්ෂයන්ට අදාල ලැබිය යුතු එකතුව රු.217,454ක වෙනත් ශේෂ සමාලෝචිත වර්ෂයේදීද අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි.

(iii) සභාව සතු ජීප් රථයක් අලුත්වැඩියා කිරීම සඳහා 2014 වර්ෂයේදී පෞද්ගලික ආයතනයකට ගෙවූ රු.100,000ක අත්තිකාරම අදාල අලුත්වැඩියාව සිදුනොකිරීම නිසා ආපසු ලබාගෙන නොතිබුණි.

**(ආ)** <u>**ගෙවිය යුතු ගිණුම්**</u>

ඉකුත් වර්ෂයන්ට අදාල එකතුව රු.636,537ක ගෙවිය යුතු ශේෂ සමාලෝචිත වර්ෂයේදීද නිරවුල් කිරීමට කටයුතුකර නොතිබුණි.

### 1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.47,259,276ක් වූ ගිණුම් විෂයයන් 03ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

### 1.3.5 අනුකූල නොවීම්

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම |
|---|---|---|---|
| (අ) | **1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත** | | |
| | (i) 21 (2) වගන්තිය | - | ප්‍රාදේශීය සභාව සතු මංමාවත් ඉන්වෙන්ට්‍රිය යාවත්කාලීනකර නොතිබුණි. |
| | (ii) 158,161,162,163 හා 166 වගන්ති | 6,458,686 | හිඟ වරිපනම් බදු සම්බන්ධයෙන් කටයුතුකර නොතිබුණි. |
| (ආ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.i ඡේදය | - | සභාව සතු වාහන 7ක් සම්බන්ධයෙන් ඉන්ධන දහනය පිළිබඳව පරීක්ෂාව සිදුකර නොතිබුණි. |
| (ඇ) | 2015 ජුලි 10 දිනැති 02/2015 අංක දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04 වගන්තිය. | - | භාවිතයට නොගන්නා වත්කම් 2015 ඔක්තෝබර් 10 දිනට පෙර අපහරණය කිරීමට කටයුතු කල යුතු වුවත්, සභාව සතු භාවිතයට නොගන්නා වාහන 4ක් සම්බන්ධව එසේ කටයුතුකර නොතිබුණි. |
| (ඈ) | ඌව පළාත් ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයාගේ 2013 ජුනි 28 දිනැති 1816/43 අංක දරන අති විශේෂ ගැසට් පත්‍රය | - | අනවසර වෙළඳසැල් හා ජංගම වෙළඳාම අධීක්ෂණය කිරීම, පාලනය කිරීම හා එම කාර්යයන් සඳහා බලපත්‍රයක් නිකුත්කිරීම හා විධිමත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |

## 02. <u>මූල්‍ය සමාලෝචනය</u>

### 2.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.14,984,246ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.12,600,603ක් විය.

### 2.2 <u>ආදායම් පරිපාලනය</u>

#### 2.2.1 <u>ඇස්තමේන්තුගත ආදායම්,බිල්කල ආදායම්,රැස්කල ආදායම් හා හිඟ ආදායම්</u>

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත්කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | **රු.** | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 6,100,000 | 6,094,213 | 2,577,954 | 3,516,258 | 6,100,000 | 6,078,864 | 2,522,700 | 3,556,164 |
| (ii) | කුලී | 10,295,000 | 11,240,685 | 8,249,725 | 2,990,959 | 15,120,000 | 12,146,357 | 9,562,055 | 2,584,302 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 2,001,200 | 1,262,387 | 1,252,937 | 9,450 | 902,000 | 1,248,155 | 1,248,155 | - |
| (iv) | වෙනත් ආදායම් | 3,687,500 | 21,702,935 | 14,006,089 | 7,696,846 | 3,875,000 | 20,050,908 | 8,520,457 | 11,530,451 |
| | **එකතුව** | **22,083,700** | **40,300,220** | **26,086,705** | **14,213,513** | **25,997,000** | **39,524,284** | **21,853,367** | **17,670,917** |

#### 2.2.2 <u>ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය</u>

සමාලෝචිත වර්ෂයේ බිල්කරන ලද රුපියල් මිලියන 40.3ක් වූ මුළු ආදායමින් වර්ෂය අවසානවන විට රුපියල් මිලියන 26.1ක් පමණක් රැස්කර තිබුණු අතර එය මුළු බිල්කළ වටිනාකමින් සියයට 65ක් තරම් අඩු අගයක් විය.

**2.2.3** <u>වරිපනම් හා බදු</u>
<u>වරිපනම්</u>

(අ) ඉකුත් වර්ෂයන්ට අදාල හිඟ වරිපනම් බදු රු.9,238,030ක් වූ අතර සමාලෝචිත වර්ෂයේ එම හිඟ බදුවලින් රු.2,779,344ක් අයකරගෙන තිබුණි. ඒ අනුව හිඟ වරිපනම් බදු අයකර ගැනීම සියයට 30ක් වැනි අඩු ප්‍රතිශතයක් විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ බිල්කල වරිපනම් බදු ආදායම රු.6,052,614ක්වූ අතර වර්ෂය තුල ඉන් රු.2,508,700ක් රැස්කරගෙන තිබුණි. ඒ අනුව ප්‍රවර්ථන වරිපනම් බදු රැස්කිරීම සියයට 41ක් තරම් අඩු ප්‍රතිශතයක් විය.

**2.2.4** <u>කුලී</u>

(අ) බදුදී තිබුණු කඩකාමර 104කින් සමාලෝචිත වර්ෂය අවසානවන විට රු.2,638,500ක කුලී අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි.

(ආ) වාර්ෂිකව බදුදෙන දේපළ 04කින් සමාලෝචිත වර්ෂය අවසානවන විට රු. 447,912ක කුලී අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි.

(ඇ) සභාව සතු දේපළ බදු දීමෙන් ඉකුත් වර්ෂයන්ට අදාලව අයවිය යුතු රු.3,057,372ක හිඟ බදු කුලී සමාලෝචිත වර්ෂය අවසානවන විටත් අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි.

(ඈ) ඉකුත් වර්ෂවලදී කඩා ඉවත්කර තිබුණු කඩකාමර 23කින් අයවිය යුතු රු.41,075ක කුලී අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි.

(ඉ) 2004/2005 වර්ෂවලට අදාල රු.38,000ක ප්‍රජාශාලා කුලී සමාලෝචිත වර්ෂය අවසානවන විටත් අයකරගෙන නොතිබුණි.

**2.2.5** <u>බලපත්‍ර ගාස්තු</u>

**(අ)** <u>වෙළඳ බලපත්‍ර</u>

සභා බලප්‍රදේශයේ ස්ථාපිතකර තිබුණු සම්ප්‍රේෂණ කුළුණු 12කින් රු.36,000ක ගාස්තු අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි.

**(ආ)** **<u>කර්මාන්ත බලපත්‍ර</u>**

1980 අංක 47 දරන ජාතික පරිසර පනතේ වගන්ති අංක 23 නියමය යටතේ අංක 1533/16 දරන 2008 ජනවාරි 23 දිනැති අතිවිශේෂ ගැසට්පත්‍රයට අනුකූලව පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාදිය යුතු කර්මාන්ත 111ක් සඳහා බලපත්‍ර ලබාදී නොතිබුණු අතර ඒ මගින් රු.444,000ක ආදායමක් අහිමිවී තිබුණි.

**2.2.6** **<u>වෙනත් ආදායම්</u>**

(අ) ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුල විවිධ ආයතන හා පුද්ගලයන් විසින් ස්ථාපිතකර තිබුණු ස්ථාවර වෙළඳ ප්‍රචාරක දැන්වීම් පිළිබඳ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි.

(ආ) අංක 1998 දරන 2016 දෙසැම්බර් 16 දිනැති ගැසට් පත්‍රය මගින් ස්ථාවර ප්‍රචාරක දැන්වීම් සඳහා ගාස්තු අයකිරීම ප්‍රසිද්ධකර තිබුණද ආයතන 13ක් විසින් ස්ථාන 07ක ප්‍රදර්ශනයකර තිබුණු දැන්වීම් පුවරු වෙනුවෙන් රු.577,390ක ගාස්තු අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි.

(ඇ) ඉඩම් වෙන්දේසි මගින් සභාවට අයවිය යුතු සියයට 1ක ගාස්තුව අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි.

(ඈ) සභාව සතු යන්ත්‍රෝපකරණ කුලියට දීමෙන් සමාලෝචිත වර්ෂය අවසානවන විට රු.936,930ක් අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි.

(ඉ) සභා බලප්‍රදේශය තුල ඇති රථවාහන නැවතුම් ස්ථාන හඳුනාගෙන අතුරු ව්‍යවස්ථා පනවා ගාස්තු අයකිරීමට කටයුතුකර නොතිබුණි.

**2.2.7** **<u>උසාවි දඩ හා මුද්දර ගාස්තු</u>**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2017 දෙසැම්බර් 31 ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.5,475,718ක් හා මුද්දර ගාස්තු රු.5,812,104ක් විය.

**03.** **<u>මෙහෙයුම් සමාලෝචනය</u>**

**3.1** **<u>කාර්යසාධනය</u>**

ප්‍රාදේශීය සභා පනතේ 3 වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ)** **<u>අතුරු ව්‍යවස්ථා</u>**

ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30ක් ඉටුකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2017 දෙසැම්බර් 31 දිනවන විටත් කාරණා 23ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි.

**(ආ)** **<u>ක්‍රියාකාරී සැලැස්ම</u>**

පනවා තිබූ අතුරු ව්‍යවස්ථා අනුව සභාව විසින් ඉටුකළ යුතුව තිබූ කර්තව්‍යයන් තීරණයකර තිබුණද වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙලකර නොතිබුණි.

**(ඇ)** **<u>ඝනඅපද්‍රව්‍ය කළමනාකරණය</u>**

(i) අංක 1998 දරන 2016 දෙසැම්බර් 18 දිනැති ගැසට් පත්‍රය මගින් කසළ ඉවත් කිරීමේ ගාස්තු අයකිරීම පිළිබඳ ප්‍රසිද්ධකර තිබුණද කසළ බදු අයකරගෙන නොතිබුණි.

(i) සභාව විසින් දිරන කසළ භාවිතා කරමින් කොම්පෝස්ට් නිපදවීමට අවශ්‍ය ක්‍රමවේදයන් සකස්කර නොතිබුණි.

**(ඈ)** **<u>පාරිසරික ගැටළු</u>**

(i) කසළ බැහැර කරන ඉඩම වටා ස්ථිර තාප්පයක් හෝ වැටක් ඉදිකර නොතිබීම හේතුවෙන් වන අලින් කසළ ආහාරයට ගැනීම නිසා ඔවුන්ගේ ජීවිතවලට හානිදායක තත්ත්වයක් ඇතිව තිබුණි.

(ii) අක්‍රමවත් ලෙස පොලිතීන්, ප්ලාස්ටික් වැනි නොදිරන අපද්‍රව්‍ය බැහැරකර තිබුණු නිසා ඒවා අවට පිහිටි තේක්ක වනවගා ඉඩම තෙක් පැතිරී ගොස් තිබුණි.

**(ඉ)** **<u>තිරසාර සංවර්ධන ඉලක්ක</u>**

තිරසාර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත්ව නොසිටීම හේතුවෙන් එම අරමුණු සඳහාවන ගෝලීය දර්ශක තුලින් සහා බලප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් 2018 මැයි 23 දින වනවිටත් සකස්කර නොතිබුණි.

**3.2** **<u>කළමනාකරණ අකාර්යක්ෂමතා</u>**

(අ) ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන (රීති) අංක 204 ප්‍රකාර භාණ්ඩ සමීක්ෂණය සඳහා ඉදිරිපත් නොකල භාණ්ඩ අයිතම 46ක් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) පුස්තකාල 06ක භාණ්ඩ සමීක්ෂණය සඳහා ඉදිරිපත් නොකළ රු.57,001ක් වූ පොත් 456ක් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ගගෙන නොතිබුණි.

**3.3** **<u>මානව සම්පත් කළමනාකරණය</u>**

**<u>සේවක ණය</u>**

දැනට සභාවේ සේවය නොකරන සේවකයින් 57දෙනෙකුගෙන් අයවිය යුතු රු.134,697ක ණය ශේෂය සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදය ප්‍රකාරව කටයුතුකර නොතිබුණි.

**3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

(අ) සභා බලප්‍රදේශය තුල පිහිටි දියුණු ප්‍රදේශ කලින් කලට නිශ්චිතව හඳුනා ගැනීමේ ක්‍රමවේදයක් සකස්කර නොතිබුණි.

(ආ) වරිපනම් බදු ප්‍රකාශයට පත්කර ඇති ප්‍රදේශය තුල තක්සේරු නොවූ දේපළ පිළිබඳ ලැයිස්තුවක් ආදායම් පරීක්ෂකවරුන් විසින් සකස්කර නොතිබුණු අතර එම දේපළ මත තාවකාලික තක්සේරුවක් සිදුකර වරිපනම් ගාස්තු අයකිරීමට කටයුතුකර නොතිබුණි.

(ඇ) වරිපනම් බලප්‍රදේශය තුල සැලසුම් කමිටු අනුමැතිය ලබා ඉදිකරනු ලබන ගොඩනැගිලි සඳහා වාර්ෂික වටිනාකම තක්සේරුකර වරිපනම් බදු අය කිරීමට ක්‍රමවේදයක් සකස්කර නොතිබුණි.

(ඇ) සභාව සතු කඩකාමර 13ක් සමාලෝචිත වර්ෂය අවසානවන විටත් බදුදීමට කටයුතුකර නොතිබුණි.

(ඉ) බදුදී තිබුණු කඩකාමර 31ක් සඳහා ගිවිසුම්ගතවී නොතිබුණි.

(ඊ) සභා බලප්‍රදේශයේ අනවසර ඉදිකිරීම් පිළිබඳ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි.

(උ) නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක 08/1/38 දරන 1985 මාර්තු 20 දිනැති චක්‍රලේඛය ප්‍රකාරව සභාව විසින් 2014,2015 සහ 2016 වර්ෂවල අනුමතකර තිබුණු ගොඩනැගිලි සැලසුම් 50ක් පරීක්ෂාකර අනුකූලතා සහතික නිකුත්කර නොතිබුණි.

(ඌ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 392/9 දරන 1986 මාර්තු 10 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය සහ නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක 08/01/38 දරන 1985 මාර්තු 20 දිනැති චක්‍රලේඛය ප්‍රකාරව සභා බලප්‍රදේශයේ සිදුකර තිබුණු ඉදිකිරීම් 37ක් සම්බන්ධයෙන් සැලසුම් කමිටු අනුමැතිය ලබාගෙන නොතිබුණි.

**3.5 වත්කම් කළමනාකරණය**

**3.5.1 පවරා නොගත් වත්කම්**

සුසානභූමි 48ක් පවරාගැනීමට කටයුතුකර නොතිබුණි.

**3.5.2 වාහන උපයෝජනය**

සභාව සතු වාහන 04ක මයිලෝ මීටරය අක්‍රීයව පැවතුණු අතර එම නිසා එම වාහන ධාවනය කළ දුර ප්‍රමාණයන් හා යෙදූ ඉන්ධන ප්‍රමාණයන් පිළිබඳ පරීක්ෂා කිරීමට නොහැකි විය.

**3.5.3 නිෂ්ක්‍රීය/ඌන උපයෝජිත වත්කම්**

ජේ.එම්. කුමාරදාස අනුස්මරණ සම්මන්ත්‍රණශාලාව වර්ෂ 02කට ආසන්න කාලයක් නිෂ්කාර්යව පැවතුණු අතර නඩත්තු කටයුතු සිදු නොකිරීම නිසා එය ගරා වැටෙමින් පැවතුණි.

## 3.6 අවිධිමත් ගනුදෙනු

සභාව වෙත පවරානොගත් මහවෙලමුල්ල පිහිටි රජයේ ඉඩමක රු.170,600ක ද්‍රව්‍ය හා ගබඩාවේ තිබුණු ජී.අයි. බට යොදාගෙන 2016 ජනවාරි මාසයේදී කම්කරු නිවාස සංකීර්ණයක් ඉදිකිරීම ආරම්භකර තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසානවන විටත් එහි ඉදිකිරීම් කටයුතු නිමකර නොතිබුණි.

## 3.7 ප්‍රසම්පාදනය

### 3.7.1 ප්‍රසම්පාදන සැලැස්ම

ප්‍රාදේශීය සභාව විසින් සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස්කර නොතිබුණි.

## 04. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

## 4.1 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂයට අදාලව ප්‍රාදේශීය සභාවේ අයවැයගත ආදායම් හා වියදම්, තථ්‍ය ආදායම් හා වියදම් අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූ බැවින් අයවැය ලේඛනය ඵලදායි පාලන කාරකයක් ලෙස උපයෝගීකරගෙන නොතිබුණි.

## 4.2 විගණන හා කළමනාකරණ කමිටු

සමාලෝචිත වර්ෂය සඳහා සභාවේ විගණන හා කළමනාකරණ කමිටු ප්‍රමාණවත් පරිදි පැවැත්වීමට කටයුතුකර නොතිබුණි.

## 05. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

| | පද්ධතිය | | අඩුපාඩුව |
|---|---|---|---|
| (අ) | ගිණුම්කරණය | (i) | ඉඩම් ගිණුම්ගත නොකිරීම |
| | | (ii) | සමාලෝචිත වර්ෂයේ මිලදීගත් ස්ථාවර වත්කම් ගිණුම්ගත නොකිරීම |
| | | (iii) | උපචිත වියදම් ගිණුම්ගත නොකිරීම |
| | | (iv) | ලැබිය යුතු ආදායම් ගිණුම්ගත නොකිරීම |
| (ආ) | වත්කම්/දේපල | | ඉඩම් පවරා ගැනීමට කටයුතු නොකිරීම |